භාණ්ඩ නම් විවෘත වෙළඳපොලේ වී (13%), කුරක්කන් (18%), කුකුල් මස් (2%), කරවල (18%), අර්තාපල් (6%), පොල් (12%), කොත්තමල්ලි (11%), කිරි (5%) සහ උකුකිරි (13%) යනාදියයි. මෙම මිල වැඩිවීම්වල බලපෑම මුංඇට (19%), සෑතුමය නොවන එළවළු (2%), වියලි මිරිස් (22%), රතුලූනු (8%), තේ (15%) සහ කෝපි (36%) යනාදියේ මිල අඩුවීම් වලින් සෑහෙන දුරට සමහන් විය. එහි ප්‍රතිඵලය වූයේ ආහාර මිල සාමාන්‍යයෙන් සියයට 10 කින් පමණ වැඩිවීමකි.

ආංශිය වර්ගීකරණයෙන් පෙන්නුම් කරන පරිදි දේශීය කාණ්ඩයට අයත් භාණ්වල මිල 1978 වර්ෂයේ දී සියයට 16 කින් වැඩිවී ඇත. පසුගිය වර්ෂයේ දී මෙම කාණ්ඩයේ මිලෙහි වැඩිවීම සියයට 9 ක් පමණ විය. මේ අතර ආනයන කාණ්ඩයේ උප දර්ශකය පසුගිය වර්ෂයේ සියයට 3 ක අඩුවීමක් දක්වූ අතර, මෙම වර්ෂයේ දී සියයට 49 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. අනෙක් අතට 1977 දී සියයට 59 කින් වැඩි වූ අපනයන භාණ්ඩ සඳහා වූ උප දර්ශකය මෙම වර්ෂයේ දී ස්ථාවරව පැවැතිණි. සමාන සංසන්දනයක් අනුව පාරිභෝගික කාණ්ඩයට අයත් භාණ්ඩ සඳහා වූ උප දර්ශකය සියයට 12 කින් වැඩිවී ඇති අතර අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා වූ උප දර්ශකයත් සියයට 30 බැගින් වැඩිවී ඇත.

### මිල පාලන හා සලාක

1977 ආර්ථික සංශෝධනයේ කොටසක් වශයෙන් භාණ්ඩ බොහොමයක් සඳහා පැවැති මිල පාලනය ඉවත් කරන ලදී. 1978 දී කොත්තමල්ලි මිල පාලනයෙන් ඉවත් කළ අතර, මිල පාලනය සඳහා කිසිදු භාණ්ඩයක් අළුතින් ඇතුලත් නොකරන ලදී. තිරිඟු පිටි, පාන්, මුං පරිප්පු, කිරි යනාදියේ පාලන මිල වැඩි කරන ලදී.

අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදහැරීම සහ සලාක ක්‍රමය සඳහා වූ වැඩ පිළිවෙල 1977 නොවැම්බර් මාසයේ ප්‍රකාශයට පත් කරන ලදුව, 1978 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක කරන ලදී. නව වැඩ පිළිවෙල යටතේ සලාක මත සහල් සහනාධාර නිකුත් කිරීම මුළු ජනගහණයෙන් අඩක් ඇතුළත් වන පරිදි අඩු ආදායම් උපයන්නන් (අවුරුද්දට රු. 3,600/—කට අඩු) කණ්ඩායමකට පමණක් සීමාකරන ලදී. සීනි සලාකය මෙම කොටසට අයත් ළමයින්ට පමණක් සීමා විය. එහි ප්‍රතිඵලයක් ලෙසු සහල් වෙළඳාමේ විශාල කොටසක් ක්ෂණිකව නිදහස් වෙළඳ පොල යටතට පත් වූ අතර, එය ඉතා කාර්යක්ෂම පරිදි ක්‍රියාත්මක වී ඇති බව පෙනේ. මේ අනුව නිදහස් වෙළඳපොලේ සාමාන්‍ය වර්ගයේ සහල් සේරුවක මිල රු. 2·90 ත්, රු 3·20 ත් අතර ස්ථායී මිලකට නැඹුරු වී ඇත.

නිදහස් වෙළඳ ක්‍රමයේ ක්‍රියාකරිත්වයට බාධා නොවන පරිදි හා පාරිභෝගිකයා සුරාකෑමෙන් වළැක්වීමේ අරමුණ ඇතිව පාරිභෝගික ආරක්ෂක නීති 1978 දී ඇති කරන ලදී. ජාතික මිල කොමිසම තම කාර්යයන් සාමාන්‍යයෙන් පොදු ව්‍යවසායයන් හි මිල නියම කිරීමට පමණක් සීමාකොට ඇත.

### වැටුප්

මහබැංකු දර්ශකයට අනුව 1977 දී සියයට 5 කින් ඉහළ ගිය රජයේ සේවකයින්ගේ අවම වැටුප් නැවත වරක් 1978 දී සියයට 15 කින් පමණ ඉහළ යන ලදී. ලිපිකාර හා කාර්මික සේවකයන්ගේ නාමික වැටුප් අනුපාතය 1977 දී සියයට 1 කින් වැඩිවීම හා සසඳන විට 1978 දී සියයට 12 කින් වැඩිවිය. මෙපරිදිම සුළු සේවකයන්ගේ හා පාසැල් ගුරුවරුන්ගේ වැටුප් පසුගිය අවුරුද්දේ සියයට 2 බැගින් වැඩිවීම හා සසඳන විට මෙම වර්ෂයේ පිළිවෙලින් සියයට 16 හා සියයට 10 බැගින් ඉහළ යන ලදී. මූල්‍ය වැටුප් අනුපාතයන්හි මෙම වර්ධනයන්ට ප්‍රධාන හේතුව නම් 1977 දෙසැම්බර් මාසයේදී රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිකිරීමයි. පසුගිය අවුරුද්දට වඩා මූල්‍ය වැටුප් සැළකිය යුතු ලෙස වැඩි වූ නමුත් 1978 වර්ෂය පුරාම ස්ථාවරව පැවැත ඇත. 1978 නොවැම්බර් මස ප්‍රකාශයට පත් කළ වැටුප් වැඩිවීම ක්‍රියාත්මක වූයේ 1979 වර්ෂයේ දීය. ආර්ථිකයේ උද්ධමන වේගය අත්හල විට මෙම අංශයේ මූර්ත වැටුප් සුළු සේවකයන්ගේ හැරුන විට අඩුවීමක් පෙන්නුම්කරයි.

පඩි පාලක සභා මගින් පාලනය වන පෞද්ගලික අංශයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් කම්කරු දෙපාර්තමේන්තුවේ වැටුප් ප්‍රමාණ දර්ශක මගින් පෙන්නුම් කරන පරිදි 1978 දී ඉහළ වර්ධන අනුපාතයක් පෙන්නුම් කරයි. කෘෂිකාර්මික අංශයේ සේවකයින්ගේ වැටුප් සියයට 45 කින් ඉහළ ගිය අතර කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයින්ගේ වැටුප් සියයට 24 කින් ඉහළ ගියේය. 1977 අදල වැටුප් වැඩිවීම පිළිවෙලින් සියයට 25 කින් හා සියයට 8 කින් විය. උද්ධමනයට සඳහා ගැලපූ විට මූර්ත වැටුප් මෙම අංශයේ වැඩිවූ බව පෙනෙන්නට ඇත. මීට හේතුවූ සාධක වූයේ 1977 දෙසැම්බර් මස රජයේ සේවකයින්ට දෙන ලද වැටුප් වැඩිවීම පෞද්ගලික අංශයේ සේවකයින්ටද ව්‍යාප්ත කිරීම, කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ ඉහළ යාම අනුව ජීවනාධාර වැඩිකිරීම සහ තේ හා රබර් වගාවන් හි මිල ඉහල යාමට අනුකූලව එම අංශවල සේවකයින්ට වැටුප් අතිරේකයන් දීම යන ආදියයි.

කෙසේ වුවද දැනට ඇති වැටුප් දර්ශක අනුව පෙන්නුම් කරන්නේ අදල අංශවල සේවක යින්ගේ අවම වැටුප් පමණක් වන අතර, අතිකාල දීමනා, වැටුප් වර්ධන, පාරිතොෂික දීමනා සහ වෙනත් දිරිගැන්වීමේ දීමනා වැනි අතිරේක ගෙවීම් මෙයට ඇතුළත් නොවන බව සඳහන් කළ යුතුය.

අඩුවන මූර්ත වැටුප් නිසා රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින් සාමාන්‍ය වැඩ කරන වේලාවන් ඉක්මවා අනවශ්‍ය අතිකාල වැඩ කිරීමෙන් හා පෞද්ගලික කෙටිකාලීන රැකියාවල්වල නිරතවීමෙන් තමන්ගේ නාමික අදායම් වලට අතිරේක ආදායමක් ලබාගැනීමට නැඹුරුවී ඇති බව පෙනේ. සේවා ස්ථානවල අධික ලෙස නොපැමිණීමේ සංඛ්‍යාව මෙයට සාක්ෂියකි. උද්ධමනය මගින් මූල්‍ය ආදායමේ මූර්ත අගය අඩුවී යාමට ඉඩහැර ඇති තත්ත්වයක් තුළදී මෙවැනි දේ නොවැළැක්විය හැක්කකි. වැටුප් වැඩි කිරීමෙන් මෙම තත්ත්වය නැති කිරීමට උත්සාහ දරනවාට වඩා නිෂ්පාදනයට වැටුප් සම්බන්ධ කිරීමෙන් හා උද්ධමනයට සරිලන සාධාරණ වන්දි ගෙවීම මෙම ප්‍රශ්ණයට වඩා ඵලදයී ක්‍රියා මාර්ගයක් වනු ඇත.

## සේවා නියුක්තිය

පසුගිය වාර්ෂික වාර්තාවල පෙන්නුම් කරන ලද පරිදි විශ්වාසදයක හා අඛණ්ඩ දත්ත නොමැතිකම ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය හා සේවා වියුක්තිය පිළිබඳ උපනති නිරීක්ෂණය කිරීමට ඇති මූලික බාධාවකි. එමනිසා මුළු ශ්‍රම බලකාය, සේවා නියුක්ති හා සේවා වියුක්ති වැනි විචල්‍යයන් අක්‍රමවත් කාල පරතරයන් තුල ජනලේඛන හා නියැදි සමීක්ෂණ මගින් ලබාගන්නා ලද දත්ත මත තක්සේරු කිරීමට සිදුවී ඇත. මෙම විචල්‍යයන් සඳහා ලබාගත හැකි අළුත්ම පූර්ණ දත්ත තිබෙනුයේ 1971 සහ 1973 යන වර්ෂ සඳහාය.

1971 ජනලේඛනයට අනුව මුළු ජන සංඛ්‍යාවෙන් සියයට 35 ක් වූ ලක්ෂ 45 ක ශ්‍රම බල කායක් විය. 1973 දී මහබැංකු මූල්‍ය හා පාරිභෝජන සමීක්ෂණයට අනුව මෙම සංඛ්‍යා මීට මඳක් වැඩිවිය. ජන සංඛ්‍යාවේ වයස් ව්‍යුහයට හා ක්‍රියාකාරි වයස් අනුපාතයන් අනුව 1978 දී මුළු ශ්‍රම බලකාය 56 ලක්ෂය දක්වා වැඩි වී ඇති බව පෙන්නුම් කරයි. එය 1978 සඳහා තක්සේරු කරන ලද ජන සංඛ්‍යාවෙන් සියයට 39 කි.

ජනලේඛන දත්තවලට අනුව 1971 දී සේවා වියුක්ති සංඛ්‍යාව 8,39,246 ක් වූ බව හෙළි විය. 1973 මූල්‍ය පාරිභෝගික සමීක්ෂණයට අනුව මෙම සංඛ්‍යාව දශ ලක්ෂයක් විය. 1978 වර්ෂය අවසානයේ දී මෙම සංඛ්‍යාව 9 ලක්ෂයක් වූ බව 1978 ඔක්තෝබර් මස ආරම්භ කරන ලද මහබැංකු පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව ලබාගත් තාවකාලික දත්ත මගින් අනාවරණය වේ. මේ අනුව 1973 සිට සේවා වියුක්ති සංඛ්‍යාවේ අඩුවක් පෙන් නුම් කරයි. කෙසේ වෙතත් මෙම දත්ත සේවා වියුක්ති මට්ටම හා උපනතිවල දර්ශකයක් ලෙස ඉතා සුපරීක්ෂාකාරීව භාවිත කළයුතු වන්නේ මෙම දත්ත ලබාගන්නා ලද්දේ සමීක් ෂණයේ මුල් වටයේ පළමු අදියරෙන් පමණක් බැවිනි.